# 04

# 'ඊඩිපස්' හා 'රත්නාවලී' නාට්‍යද්වයෙහි ගැටුමෙහි සාදෘශ්‍යතාව හා දෘෂ්ටියෙහි විසදෘශ්‍යතාව

*උදයකුමාර, එස්. එම්. කේ. එම්.* [1]

ග්‍රීක නාට්‍යකරු සොෆොක්ලීස්ගේ 'ඊඩිපස්', සම්භාව්‍ය අපරදිග නාට්‍ය කෘතියකි. 'රත්නාවලී' පෙරදිග සම්ප්‍රදායට අයත් හර්ෂදේවයන්ගේ දෘශ්‍යකාව්‍ය නිර්මාණයකි. රත්නාවලී නාට්‍යය, භරත මුනිවරයාගේ නාට්‍යශාස්ත්‍රීය සිද්ධාන්ත මනාව භාවිත කළ ප්‍රශස්ත නිර්මාණයකි. ඇරිස්ටෝටල් ස්වකීය කාව්‍යශාස්ත්‍රයේ අග්‍රගන්‍යතම ශෝකාන්තය ලෙස නම් කර ඇත්තේ 'ඊඩිපස්' නාට්‍යයයි. ඊඩිපස් හා රත්නාවලී තුලනාත්මක ව අධ්‍යයනයේ දී සන්දර්භය හා අභිලාෂ වශයෙන් සාදෘශ්‍ය ලක්ෂණ උසුලන බව පෙනෙයි. ඊඩිපස් රජු දෛවයෙහි සරදමින් පීඩා විඳි සානුකම්පිත චරිතයකි. දෛවය, ඉරණම, කර්මය නිසර්ගසිද්ධ උරුමයක් ද නැතහොත් අදෘශ්‍යමාන බලවත් හස්තයක අනුල්ලංඝනීය ආක්‍රමයණයක්දැයි නිර්ණය කිරීම සුකර නොවේ. යථාර්ථවාදී දෘෂ්ටි කෝණයෙන් සමස්තය නිර්ණය කිරීම අපරදිග සාහිත්‍ය නිර්මාණයන්ට පොදු ලක්ෂණයකි. දෛවය පිළිබඳ ඊඩිපස් නාට්‍ය නිර්මාණය ඔස්සේ සොෆොක්ලීස්, සහෘදයා සුපෝෂණය කරනු ලබන්නේ යථාර්ථවාදී චින්තනයෙනි. උදේනි රජු දෛවයෙන් සන්තෘෂ්ටිය ලද භාග්‍යවන්තයෙකි. දෛවයෙහි සරදමට ගොදුරු වූ රත්නාවලී අනවරත අනපෙක්ෂිත සිද්ධි සන්තතියකින් පීඩාවට පත් වේ. එහෙත් නාට්‍යාවසානය සුඛාන්තයක් වේ. දෛවය හා ඉරණම යන සංකල්පීය ගැටුම කෙන්ද්‍රය වූ මේ නාට්‍යද්වයේ දී 'ඊඩිපස්', දුක්ඛාන්ත වීමටත් 'රත්නාවලී' සුඛාන්ත වීමටත් බල පෑ හේතු සාධක ගවේෂණය කළ යුතු වේ. 'ඊඩිපස්' නාට්‍ය නැරඹූ ප්‍රේක්ෂකයෝ සානුකම්පිත වූහ. එපමණක් නොව එමඟින් ඔවුහු ජීවිතාවබෝධය ලබා ගත්තෝ ය. රත්නාවලී නාටිකාවේ ඉරණමට සමපාත සිද්ධීන්හි ආවසානික අග්‍රඵලය සුඛාන්තයකි. සහෘදයා අනන්දයෙන් ප්‍රඥාව කරා මෙහෙය වීමේ ගුණයෙන් ආඪ්‍ය වීම එහි මුඛ්‍ය ලක්ෂණයකි. යථාරූපී චින්තනය අනුගමනය කළ අපරදිග නාට්‍ය සම්ප්‍රදාය තුළ දී ඉරණම අනුව සියල්ල සිදු වේ. එහි දී නාට්‍යකරුවා ඛේදාන්තයක් නිර්මාණය කරයි. යථාරූපී බව පසෙක ලා පෙරදිග නාට්‍යකරුවා සුඛාන්තයක් නිර්මාණය කරයි. නාට්‍යද්වයෙහි අරමුණ ඒකස්වරූපී වුව ද නාට්‍යදෘෂ්ටීන්හි පවත්නේ විසදෘශ්‍යතාවකි. මේ අනුව පෙනී යන්නේ ද්විතීය සාම්ප්‍රදායික ළදරු සමාජයේ උපත ලද්දා වූ රසිකත්වය තුළ ඉරණම යනු දේව හස්තයක් බවයි. එය හුවා දැක්වීමට නාට්‍යකරුවා ස්වකීය සමකාලීන සමාජ තත්ත්වයන්ට අනුගත ව ස්වකීය නාට්‍ය නිර්මාණ බිහි කළ බව පෙනේ. මිනිසා හා අදෘශ්‍යමාන සංසිද්ධීන්හි සට්ටනය සාහිත්‍යකරුවා ස්පර්ශ කර ඇති ආකාරය ඊඩිපස් හා රත්නාවලී මඟින් ගවේෂණය කිරීම මෙහි මුඛ්‍යාභිලාෂය වේ. මේ සඳහා 'ඊඩිපස්' හා 'රත්නාවලී' නාට්‍ය පෙළ ඇතුළු ප්‍රාථමික මූලාශ්‍රයන් ද, ග්‍රීක නාට්‍ය කලාව හා තදනුබද්ධ අවශේෂ සාහිත්‍ය නිර්මාණ ද, පෙරදිග නාට්‍ය සාහිත්‍යය ද ද්විතීයික මූලාශ්‍රය ලෙස භාවිත කෙරේ.

ප්‍රමුඛ පදඃ සාදෘශ්‍යතාව, දෘෂ්ටිය, විසදෘශ්‍යතාව, සුඛාන්තය, ගැටුම

---

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) පළමු වසර, සිංහල අධ්‍යයනාංශය.* koshila.madushani11@gmail.com